මාගේ ප්රජාවෙන් හැත්තෑ දහසක් දෙනා කිසිදු විනිශ්චයකින් හෝ කිසිදු දඬුවම් කිරීමකින් හෝ තොරව ස්වර්ගයට ඇතුළත් කරන බවට මාගේ පරමාධිපති මට ප්රතිඥා දී ඇත. ඒ සෑම හැත්තෑ දහසක් දෙනා සමග මාගේ පරමාධිපතිගේ අතලොස්ස තුනක් තිබෙනු ඇත.

අබූ උමාමා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී. මෙය මර්ෆූඃ ගණයට අයත් හදීසයකි. “මාගේ ප්රජාවෙන් හැත්තෑ දහසක් දෙනා කිසිදු විනිශ්චයකින් හෝ කිසිදු
දඬුවම් කිරීමකින් හෝ තොරව ස්වර්ගයට ඇතුළත් කරන බවට මාගේ පරමාධිපති මට ප්රතිඥා
දී ඇත. ඒ සෑම හැත්තෑ දහසක් දෙනා සමග මාගේ පරමාධිපතිගේ අතලොස්ස තුනක් තිබෙනු ඇත.” [පූර්ව සාධක සහිත හදීසයකි] [ඉබ්නු මාජාහ් එය වාර්තා කර ඇත - ඉමාම් තිර්මිදි එය වාර්තා කර ඇත - අහ්මද් එය වාර්තා කර ඇත]

සැබැවින්ම උත්තරීතර අල්ලාහ් කිසිදු විනිශ්චයකින් හෝ දඬුවම් කිරීමකින් තොරව මෙම ප්රජාවෙන් හැත්තෑ දහසක් දෙනා ස්වර්ගයට ඇතුළත් කරන බවට තමන්ට පොරොන්දු දී ඇතැයි නබි (සල්ලල්ලාලහු අලයිහි වසල්ලම්) තුමා අපට දන්වා ඇත. ඒ සෑම හැත්තෑ දහසක පිරිස සමග තවත් හැත්තෑ දහසක් දෙනා වෙති. ඔහුගේ ගෞරවනීය අතින් මිටි තුනකින් ඔවුන්ව හසුකරගනු ඇත. පසුව ස්වර්ග උයනට ඇතුළත් කරනු ඇත.

https://sunnah.global/hadeeth/si/show/8282